# 07. නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම - ගැලීම් සටහන

| | |
|---|---|
| ඩිජිටල්කරණ දත්ත භාවිත කිරීම | ඉලෙක්ට්‍රොනික පණිවුඩ / ගනුදෙනු (malimbada.ps@gmail.com) |

නොපවරා ගැනීමේ සහතිකයක් ලබා දෙන ලෙසට වූ ඉල්ලීමේ ලිපියක් අන්තර්ජාලය ඔස්සේ හෝ භෞතිකව පෙරටු කාර්යාලයට භාර ගැනීම

වගකීම: පෙරටු කාර්යාල නිලධාරි

↓

සභාවට අය විය යුතු මුදල් හිඟ ව තිබේ ද යන්න පරීක්ෂා කර එවැනි යම් මුදල් ප්‍රමාණයක් වේ නම්, එම මුදල් ප්‍රමාණය සහ නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීමේ ගාස්තුව ගෙවන ලෙස ඉල්ලුම්කරු දැනුම්වත් කිරීම

වගකීම: පෙරටු කාර්යාල නිලධාරි

↓

ගෙවිය යුතු හිඟ මුදලක් වේ නම්, එය ද සමග නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීමේ ගාස්තුව ගෙවීම

වගකීම: ඉල්ලුම්කරු

↓

අදාළ මුදල් අය කර ගෙන ලදුපත සහ නොපවරා ගැනීමේ සහතිකය නිකුත් කිරීම

වගකීම: පෙරටු කාර්යාල නිලධාරි

කාර්යසාධක දර්ශකය



# 07. නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම

## 1. හැඳින්වීම

නොපවරා ගැනීමේ සහතිකය අවශ්‍ය වන්නේ යම් තැනැත්තෙකු විසින් තම දේපළ උකසට හෝ ඇපයට තබා ණය මුදලක් ඉල්ලුම් කරන අවස්ථාවක ණය නිකුත් කරනු ලබන මූල්‍ය ආයතනය විසින් කරනු ලබන දැන්වීම අනුව ය. නොපවරා ගැනීමේ සහතිකය යනු කිසියම් නිශ්චල දේපළක් සභාවට පවරා ගැනීමට බලපාන තත්ත්වයක් උද්ගත වී නොමැති බවට නිකුත් කරනු ලබන සහතිකයකි. කිසියම් නිශ්චල දේපළක් සභාවට පවරා ගැනීම සිදු කරනු ලබන්නේ සභාවට අය විය යුතු යම් මුදලක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක දී ය. ඒ නිශ්චල දේපළ සභාවට අත්පත් කරගෙන විකිණීමෙන් අදාළ හිඟ මුදල අය කර ගනු ඇත. යම් සංවර්ධන කාර්යයක් සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සමග කවර හෝ ආකාරයක සම්බන්ධතාවක් මෙම සහතිකය මගින් ප්‍රකාශ වන්නේ නැත. මෙම සහතිකය නිකුත් කළ දින සිට මාස 6 ක කාලසීමාවකට පමණක් එය වලංගු වේ.

## 2. නීතිමය අධිකාරය

(අ) 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 252, 253, 255, 256, 257 සහ 259 වන වගන්ති;

(ආ) 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 166 වන වගන්තිය සමග කියවිය යුතු මහා නගර සභා ආඥාපනතේ 252, 253, 255, 256, 257 සහ 259 වන වගන්ති;

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158, 159, 161, 162, 163, 164, 165 සහ 166 වගන්ති.

## 3. සුදුසුකම්

(අ) තක්සේරු ලේඛනයේ අදාළ දේපළෙහි නීත්‍යානුකූල අයිතිකරු ලෙස නම සඳහන් වී ඇති තැනැත්තා මෙම විස්තර ඉල්ලා සිටීමට හිමිකම් ලබනු ඇත.

(ආ) දේපළෙහි නීත්‍යානුකූල අයිතිකරු නොවන යම් තැනැත්තකු විසින් මෙම විස්තර ඉල්ලා සිටින්නේ නම්, නීත්‍යානුකූල අයිතිකරු විසින් ඒ සඳහා ලියවිල්ලකින් ඔහුට බලය පවරා තිබිය යුතු ය.

(ඇ) සහතිකය ඉල්ලුම් කරන දින වන විට සභාවට අය විය යුතු සියලු ම මුදල් ගෙවා අවසන් කර තිබිය යුතු ය.

## 4. ගාස්තු

පළාත් පාලන ආයතනය විසින් කලින් කල තීරණය කර ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරනු ලබන ගාස්තුවක් අය කරනු ලැබේ.

සටහන: මේ සඳහා අය කරන ගාස්තුව සාධාරණ විය යුතු ය.

## 5. සැපයිය යුතු ලේඛන

(අ) ඉල්ලුම්කරු දේපළෙහි නීත්‍යානුකූල හිමිකාරත්වය ඇති තැනැත්තා වන විට, නො පවරා ගැනීමේ සහතිකය අවශ්‍ය කරන දේපළෙහි විස්තර (දේපළ පිහිටි ස්ථානයේ ලිපිනය, වරිපනම් අංකය) ඇතුළත් කරන ලද ලිපියක් මගින් කරනු ලබන ඉල්ලීමක්;

(ආ) ඉල්ලුම්කරු දේපළෙහි නීත්‍යානුකූල හිමිකාරත්වය ඇති තැනැත්තා නොවන විට, ඉල්ලුම්කරුට මෙම විස්තර නිකුත් කිරීමට විරුද්ධත්වයක් නැති බව සහ ඒ විස්තර ලබා ගැනීමට ඉල්ලුම්කරුට බලය පවරන ලද බවට නීත්‍යානුකූල හිමිකරු විසින් ලිඛිත ව බලය පවරන ලද සාමදාන විනිශ්චයකාරවරයකු විසින් සහතික කරන ලද ලිපියක්.

## 6. ඉල්ලුම් කිරීමේ පටිපාටිය

| පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|
| නොපවරා ගැනීමේ සහතිකය ඉල්ලීමේ ලිපිය භාර ගැනීම | | පෙරටු කාර්යාල නිලධාරි |
| සභාවට අය විය යුතු මුදලක් හිඟ ව තිබේ ද යන්න පරීක්ෂා කර යම් මුදල් ප්‍රමාණයක් වේ නම්, එය ද සමග නොපවරා ගැනීමේ සහතිකය නිකුත් කිරීමේ ගාස්තු ගෙවන ලෙස ඉල්ලුම්කරු දැනුම්වත් කිරීම | ඉල්ලුම් පත්‍රය ලැබුණු අවස්ථාවේ දී ම | පෙරටු කාර්යාල නිලධාරි |
| අදාළ ගෙවීම් අය කර ගෙන ලදුපතක් නිකුත් කිරීම | ඉල්ලුම් පත්‍රය ලැබුණු අවස්ථාවේ දී ම | පෙරටු කාර්යාල නිලධාරි |
| නොපවරා ගැනීමේ සහතිකය නිකුත් කිරීම | ඉල්ලුම් පත්‍රය ලැබුණු අවස්ථාවේ දී ම | පෙරටු කාර්යාල නිලධාරි |

සටහන: මෙහි ඇමුණුමෙහි ආකෘතිය අනුව නො පවරා ගැනීමේ සහතිකය නිකුත් කරනු ලැබේ.

ඇමුණුම

මගේ අංකය: . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . සභාව,

. . . . . . . . . . . . . . . . .

20 . . . . . . . . . . . . . . . . දින.

. . . . . . . . . . . . . . . . . . මහත්මා / මහත්මිය / මෙනෙවිය,

මහත්මයාණෙනි / මහත්මියනි / මෙනෙවියනි,

## <u>නො පවරා ගැනීමේ සහතිකය</u>

20 . . . . . . . . . . . . දින ඔබ විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම හා බැඳේ.

**02**. . . . . . . . . . . . . . . සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි පහත සඳහන් දේපළ වෙනුවෙන්, 20 . . . . . . . . . . . දින දක්වා මෙම සභාවට ගෙවිය යුතු වන සියලු ම ආකාරයේ වරිපනම් හා වෙනත් බදු සියල්ල ම ගෙවා අවසන් කර ඇති බැවින් 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 252, 253, 255, 256, 257 සහ 259 වන වගන්ති / 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 166 වන වගන්තිය සමග කියවිය යුතු මහා නගර සභා ආඥාපනතේ 252, 253, 255, 256, 257 සහ 259 වන වගන්ති / 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වන වගන්තිය, 159, 162, 163 සහ 166 යන වගන්ති * යටතේ ඒ දේපළ මෙම සභාව වෙත පවරා ගැනීමට ක්‍රියා නො කරන බව මෙයින් සහතික කරමි.

1. ඉඩමේ පිහිටීම (ලිපිනය): . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
2. වරිපනම් අංකය: . . . . . . . . . . . . . . . . . . . . . . . (පාරේ නම සමග වරිපනම් අංකය) . . . . . . . . . . . . . . . . . . . . . . .

**03**. මේ සහතිකය පහත සඳහන් කොන්දේසිවලට යටත් ව නිකුත් කරනු ලැබේ.

1. මාර්ග පුළුල් කිරීම හෝ වෙනත් යම් අවශ්‍යතාවක් මත ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ කරනු ලබන අත්පත් කර ගැනීම්, මේ සහතිකයෙන් ආවරණය නොවේ.
2. මේ සහතිකය නිකුත් කළ දින සිට මාස 6 ක කාලයකට පමණක් වලංගු වේ.

මෙයට විශ්වාසී,

QR Code

. . . . . . . . . . (නම) . . . . . . . . . .

පෙරටු කාර්යාල නිලධාරි,

ගණකාධිකාරී / ලේකම් වෙනුවට

. . . . . . . . . . . . . . . . . . සභාව

(නිල මුද්‍රාව තබන්න)